දිනමිණ සිළුමිණ The Sunday Island epaper

ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව

අධ්‍යාපන අමාත්‍යාංශය

ඇබෑර්තු

ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව යනු, රටෙහි රාජ්‍ය අංශයේ විද්‍යඥයන්හට මූල්‍ය සහාය ලබාදෙනු ලබන රජයේ අරමුදල් මත ක්‍රියාත්මක නියෝජිතායතනයකි.

ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාවේ (NRC) පවත්නා පහත සඳහන් තනතුරු පිරවීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

විද්‍යාත්මක / පර්යේෂණ නිලධාරී - AR1 - තනතුරු 02

රැකියා විස්තරය : පර්යේෂණ ව්‍යාපෘති කළමනාකරණය, ව්‍යාපෘති තොරතුරු ප්‍රකාශනය, දත්ත සමුදාය පවත්වා ගැනීම, සංඛ්‍යාත විශ්ලේෂණය, වාර්තා සකස් කිරීම සහ සම්මන්ත්‍රණ / වැඩමුළු වැනි අවස්ථා සම්බන්ධීකරණය.

සුදුසුකම් :

බාහිර අයදුම්කරුවන් : (1 හෝ 2)

1) ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යා, වෛද්‍ය, ඉංජිනේරු විද්‍යා, කෘෂිකර්ම, ආර්ථික විද්‍යා, සංඛ්‍යානය, ICT පරිගණක විද්‍යා, තොරතුරු තාක්ෂණ, පරිගණක ඉංජිනේරු විද්‍යා හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයේ විශේෂ උපාධියක්,

හෝ

2) ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, විද්‍යා, වෛද්‍ය, ඉංජිනේරු විද්‍යා, කෘෂිකර්ම, ආර්ථික විද්‍යා, සංඛ්‍යාන, ICT පරිගණක විද්‍යා, තොරතුරු තාක්ෂණ, පරිගණක ඉංජිනේරු විද්‍යා හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයේ සාමාන්‍ය උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ උපාධි ඩිප්ලෝමාවක්.

වයස : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්හට අදාළ නැත.

වැටුප් පරිමාණය : AR1 - 2016 [රුපියල් 53,150/- 10x1,375/- 15x1,910/- 95,550/-]

ගිණුම් නිලධාරී - JM 1-1 - තනතුරු 01

රැකියා විස්තරය : මූල්‍ය කළමනාකරණ හා විගණන ක්‍රියාකාරකම්, අයවැය වාර්තා සැකසීම, ගිණුම්කරණ දත්ත සමුදාය යාවත්කාලීනකරණය හා විගණන කමිටුව සමග සම්බන්ධීකරණය සඳහා වගකීම දරයි.

සුදුසුකම් :

බාහිර අයදුම්කරුවන් : (1 හෝ 2)

1) ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ව්‍යාපාර පරිපාලන, ගණකාධිකරණ, කළමනාකරණ හෝ වාණිජ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්

හෝ

2) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ පිළිගත් වරළත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍ය විභාගය සමත් වීම.

සහ

රාජ්‍ය අංශයේ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක, සුදුසුකම් ලැබීමෙන් පසු අවම එක් වසරක පළපුරුද්ද.

අභ්‍යන්තර අයදුම්කරුවන් :

1) ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.

හෝ

2) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන (MA1) II ශ්‍රේණිය තනතුරක අවම වසර පහක (05) සතුටුදායක සේවයක් සම්පූර්ණ කොට තිබීම.

වයස : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්හට අදාළ නැත.

වැටුප් පරිමාණය : JM 1-1 - 2016 [රුපියල් 42,600/- 10x755/- 18x1,135/- 70,580]

සියලුම තනතුරුවලට අදාළ වෙනත් කොන්දේසි :

1) අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

2) තනතුරට අදාළ රාජකාරී නිසිලෙස ඉටුකිරීම සඳහාත්, දිවයිනෙහි ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහාත් මනා ශාරීරික හා මානසික සුවතාවයෙන් යුක්ත විය යුතුය.

3) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් හෙබි විය යුතුය.

4) බඳවා ගැනීම, ලිඛිත තරගකාරී විභාගයක් සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සිදු කෙරේ.

5) තනතුරේ ස්වභාවය ස්ථිර වන අතර, සේවක අර්ථසාධක අරමුදලට (EPF) හා සේවක භාර අරමුදලට (ETF) හිමිකම ඇත.

6) අයදුම්කරුවන් විසින්, සම්පූර්ණ ජීවදත්ත, උප්පැන්න සහතිකය, වෙනත් අදාළ සහතිකවල පිටපත් සමග ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නාමයන් හා ලිපිනයන් ඇතුළත්ව අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර, අදාළ අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කොට, 2023 නොවැම්බර් 14 දිනට පෙර ලැබෙනසේ, ලියාපදිංචි තැපෑලෙන්, "**සභාපති, ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව, 120/7, විද්‍යා මාවත, කොළඹ 07**" යන ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය.

7) රජයේ දෙපාර්තමේන්තු / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල නිලධාරීන් තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුය.

8) ඉහත අවශ්‍යතාවලට අනුකූල නොවන ලෙස ඉදිරිපත් කරනු ලබන සියලුම අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

මෙම දැන්වීම, NRC වෙබ් අඩවිය වන www.nrc.gov.lk හිද පළකොට ඇත.

සභාපති,
ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව,
120/7, විද්‍යා මාවත,
කොළඹ 07.

දුරකථන : 011-2675176, 2675430
ෆැක්ස් : 011-2675136